# සංචරණය හා අම්බලම පිළිබඳ උරුම කළමනාකරණ විමසුම: ගම්පහ දිස්ත්‍රික්කයේ තෝරා ගත් අම්බලම් හතරක් පිළිබඳ විශේෂ අවධානයක්

ඩබ්ලිව්. එම්. ටී. බී. විජේපාල

කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
tbwijepala@gmail.com

## හැඳින්වීම

ශිලා පරිහරණීත අවධියෙන් අනතුරුව මානවයා විකසනය වූ හා ක්‍රමානුකූලව සකස් වූ සමාජ සංස්කෘතික පරිසරය තුළ තමන්නට ආවේණික ස්වභාවයක් ස්ථාපිත කර ගන්නා ලදි. සරළ සමාජයේ සිට සංකීර්ණ සමාජය දක්වා මිනිසාගේ ගණුදෙනුකාර පරිසරය වෙනස් වීමේ දී 'ගම' මූලික පරිසර සන්දර්භයක් ගොඩනගන්නට ද විය. එහි සංවිධානාත්මක සැකැස්ම තුළ පාලනය හා නිළය පිළිබඳ ධූරාවලියක් සැකසිණ. ඒ අනුව මෙම කුඩා ම ඒකකයෙහි පරිපාලන ප්‍රධාණීන් 'ගමික' වරු වූ බව පැරණි ශිලා ලේඛනයන් හි සාක්‍ෂ්‍ය දරයි. ඉතා පැරණි යුගයේ නිර්මාණාත්මක හෝ වාස්තුවිද්‍යාත්මක ස්වභාවයන් පිළිබඳ සාක්‍ෂ්‍ය නොවූවත්, විශේෂයෙන් මහනුවර යුගයේ දී ගම මූලික සමාජ සැකැස්ම තුළ සංවිධානාත්මක ස්ථාපිතයක් ලෙස 'අම්බලම'ට සුවිශේෂීත්වයක් හිමි ව තිබුණි. මිනිසා අනාදිමත් කාලයක පටන් සංචරණය කෙරෙහි ලොල් වූ බව ද සාක්‍ෂ්‍ය සහිතව හඳුනා ගත හැකිය. අප්‍රිකාවෙන් නික්මුන මානවයා ඉතා දීර්ඝ කාලයක් හමුවේ ලෝකයේ විවිධ ප්‍රදේශ ඇසුරෙහි ස්වකීය ආධිපත්‍යය පැතිරවීම සංචරණයේ ප්‍රතිඵලයක් ලෙස දැක්වීම සාවද්‍යයක් නොවේ. වර්තමානයේ දී ගම, පලාත, දිස්ත්‍රික්කය, රාජ්‍යය, අර්ධද්වීපය, මහද්වීපය පරයා ලෝකාන්තර සංචරණය කෙරෙහි ද මිනිස් අවධානය යොමු ව තිබේ. මෙහි කුඩාම ඒකකය සේ සළකනු ලබන ගම මූලික සංචරණයේ දී එහි සුවිශේෂී සංස්ථාවක් සේ කැපී පෙනෙන අම්බලම ට හිමිවන ස්ථානය පිළිබඳව සැළකුව මනාය. නූතන සංචාරක ක්ෂේත්‍රය තුළ 'ගම' කෙරෙහි අතීතාවර්ජනයක් කිරීමෙහි හොඳම නිදර්ශකයක් ලෙස ඉසිඹුහල හෙවත් අම්බලම පෙන්වා දිය හැකිය. මන්ද අතීත මාර්ග පද්ධතියේ ව්‍යාප්තිය පිළිබඳ නිහිඩ සාක්‍ෂ්‍ය මෙම අම්බලම් තුළින් ප්‍රකාශිත බැවිනි. ගම, අම්බලම, අතීත මාර්ග පද්ධතිය සමග බැඳි ප්‍රයාණයන් සංචරණයේ නූතන දිශානතිය හා මුහු කිරීමෙන් නව ආරක සංචරණ ප්‍රවේශයක් හඳුනා ගැනීමේ හැකියාව තිබේ.

## අරමුණ

හුදකලා අනන්‍යතාවක් ප්‍රකාශ කරන දේශීය සංස්කෘතියේ සුවිශේෂී කලාත්මක හා වාස්තුවිද්‍යාත්මක නිමැවුමක් වන 'අම්බලම' නූතන සංචාරක අභිප්‍රේරණයක් සේ පිළිගැන්වීමේ හැකියාව පිළිබඳ තෝරා ගන්නා ලද ස්ථාන කිහිපයක් ඇසුරින් විශ්ලේෂණය කිරීම හා ඊට අදාළ සාධනීය අවකාශ මෙන්ම අභියෝගයන් හඳුනා ගැනීම.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී ප්‍රධාන වශයෙන් ආකාර දෙකක සාක්‍ෂ්‍ය සංස්පර්ශයක් කෙරෙහි අවධානය යොමු විය. ක්ෂේත්‍ර සමීක්‍ෂණය ප්‍රමුඛව ද, පුස්තක අධ්‍යයනය දෙවනුව ද සිදු කරනු ලැබූ අතර පර්යේෂණ දිශානතිය තීරණය කිරීමේ දී සම්මුඛ සාකච්ඡා තුළින් පුළුල් අවබෝධයක් ලැබුණි. තෝරා ගන්නා ලද ස්ථානයන් හි භෞතික පිහිටීම, හායනයේ ස්වභාවය, පිළියම්, ප්‍රවේශ මාර්ග, නඩත්තුව, භාවිතය මෙන්ම

-වර්තමාන සමාජයීය භූමිකාව හඳුනා ගැනීම සඳහා විශේෂයෙන් ක්ෂේත්‍ර සමීක්ෂණය උපකාරී විය.

## විමර්ශනය

පර්යේෂණයේ දී විශේෂ අවධානය යොමු කරන ලද ප්‍රධාන ස්ථාන හතරකි. ඒවා සියල්ල ගම්පහ දිස්ත්‍රික්කයේ එකිනෙකට ආසන්නව පිහිටා තිබේ. ඒ ඇවරියවල අම්බලම, අඹගස්පිටිය අම්බලම, ගලේ කඩේ අම්බලම හා ගල් ළිඳවත්ත අම්බලම යනා දී වශයෙනි. කොළඹ - නුවර නව මාර්ගයේ යක්කල දක්වා පැමිණ, එහි සිට කිරිඳිවැල (231) මාර්ගයේ කි.මී. 2.5 - 5.5 ක පමණ දුරක දී මෙම අම්බලම් හතරම දැක ගත හැකිය.

ඇවරියවල අම්බලමෙහි සුවිශේෂත්වය නම් එය වෙල් යායකට මැදි වූ සුන්දර වටපිටාවකින් යුතුව, ගලා යන දිය පාරක් අසළ ගල් තලාවක පිහිටුවා තිබීමයි ( GPS ඛණ්ඩාංක E 001 21 659 හා N 002 10 215). හැරත් ගල් තලාවක් මත ගල් කුට්ටි තබා, ඒවා මත්තෙහි දැවයෙන් කරන ලද ඉදිකිරීමෙහි පොල් අතු සෙවිල්ලන ලද බවට මෙතෙක් ශ්‍රී ලංකාවෙන් හමුවන එකම 'ඉසිඹුහල' මෙය ලෙස වාර්තා වේ. දෙවැන්න වූ අඹගස්පිටිය අම්බලම ආසන්නයේ ළිඳක් ද සහිතව නිර්මාණය කරන ලද්දකි. විඩාව සඳහා අම්බලම ද, පැන් පවස සඳහා ළිඳ ද අතීත ජනතාව වෙනුවෙන් සහයෝගාත්මක වත්නට ඇතැයි නිශ්චය කිරීම සහේතුකය. කිරිඳිවැල මාර්ගයට වඩාත් ආසන්න වූ මෙම අම්බලම GPS ඛණ්ඩාංක E 001 22 012 හා N 002 09 408 ඔස්සේ ස්ථාපිතව තිබේ. දිග පළලින් මී. 6x6 ප්‍රමාණයේ සමචතුරස්‍රාකාර ගොඩනැගිල්ලක් වූ මෙහි ඉහළට එසවුන ශිලා ස්ථම්භ 12ක් මත වහලය ස්ථාපිතව ඇත. බාග බිත්ති නිසා ශිලා ටැම් හි පහළ කොටස් ඉන් ආවරණිතය. ඉහළට එසැවී ගත් ශිලා ස්ථම්භවල විවිධ කැටයම් රූප අර්ධ උන්නත ලෙස මතුකර තිබේ. ඇත් රූප, විවිධ මල් මෝස්තර, සත්ත්ව හිස සහිත මිනිස් රූප මෙන්ම ස්ථිර වශයෙන් හඳුනා ගත නොහැකි ජ්‍යාමිතික හා වෙනත් රූප කිහිපයක්ම ද මේ අතර වේ. වහලය දැවයෙන් නිම කොට උළු සෙවිල්ලා තිබේ. 2012.11.22 දින අංක 1264 යටතේ ආරක්ෂිත ස්මාරකයක් ලෙස මෙම ස්ථාන දෙකම ප්‍රකාශයට පත්කර ඇත. ගල්ළිඳවත්ත අම්බලම ලිඛිත සාක්ෂ්‍ය විරහිත ඉතා කුඩා ප්‍රමාණයේ ඉදිකිරීමකි ( GPS ඛණ්ඩාංක E 001 21 233 හා N 002 09 026). බැලූ බැල්මට අම්බලමක් සේ නිශ්චය කිරීමට පවා අපහසු, දිග පළලින් මී. 2.6 x 2.6 ක් වැනි කුඩා වපසරියක් තුළ ශිලා ටැම් සතරක් මත උළු සෙවිල්ලන ලද වහලයක් පමණක් වන සේ මෙය නිර්මාණය කර තිබේ. මෙය විශේෂයෙන් අම්බලම් සංස්කෘතියේ විවිධතාව ප්‍රකාශ කිරීමේ සළකුණක් ලෙස ද පෙන්වා දිය හැකිය. බොහෝ දුරට ආසන්නයේ පවත්නා ළිඳ ආශ්‍රය කරන්නවුන්ගේ අවශ්‍යතා පිරිමැස්ම වෙනුවෙන් මෙය භාවිත වූ (වර්තමානයේ දීත් වන) බවට ද පළිගැනීමකි. ගලේ කඩේ අම්බලම, ඉහත අම්බලම් කාලානුරූපව පෙළ ගස්වයි නම් අවසාන අවධිය නියෝජනය කරන වාස්තුකර්මයයි. එය ගඩොලින් බැඳ කපරාරු කරන ලද බිත්ති හා කණු මෙන්ම කොකු උළු සෙවිල්ලන ලද වහලයකින් යුතු නිර්මාණයකි (GPS ඛණ්ඩාංක E 002 22 150 හා N 002 10 112).

මෙම අම්බලම් හේතු ප්‍රත්‍ය නොමැතිව නිමවන ලද නිර්මාණයන් නොවේ. හුදෙක් කැළණි වැඳුමට උතුරු දෙස රජරට හෝ දක්ඛිණ දේශයෙන් පැමිණියවුන්ගේ අවශ්‍යතා සපුරාලනුවස් මෙම අම්බලම් ගොණුව භාවිතයට ගැනෙන්නට ඇතැයි නිශ්චය කළ හැකිය (සිතියම). ඒ අනුව ඉහත බැතිමතුන් සඳහා වන මාර්ගයක් මෙම කලාපය ඔස්සේ වැටී තිබීමේ වැඩි ඉඩකඩක් ද තිබේ.

නූතන සංචාරක ක්ෂේත්‍රය තුළ පිබිදෙමින් පවත්නා රාජ්‍යයන් අතරට ශ්‍රී ලංකාව ද එක් වී ඇත. ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ද නව සංචාරක ආකර්ශිතයන් කෙරෙහි අවධානය යොමු කරවන මෙවන් සමයෙක, ප්‍රධාන සංචාරක ප්‍රවේශයක් ලෙස හෝ අතුරු ප්‍රවේශයක් ලෙස අම්බලම හා බැඳි අතීත සංස්කෘතිය පිළිබඳව අවධානය යොමු කර වීමේ හැකියාව පවත්නා බව හඳුනා ගන්නා ලදි. මෙරට සංස්කෘතියේ විවිධතාව විදේශීය මෙන්ම දේශීය සංචාරකයාගේ අවධානයට පාත්‍රව ඇති බැවින් 'අම්බලම', 'ඒ හා බැඳි සංස්කෘතිය' පිළිබඳ තතු ක්‍රමාණුකූල ලෙස ඉදිරිපත් කිරීමේ යොමුවක් රාජ්‍ය මැදිහත් වීමෙන් ද, සංචාරක මණ්ඩලය වැනි ආයතන ඔස්සේ



ඇටවිරියවල අම්බලම




අඹගෙජ්සිටිය අම්බලම



ගල්ඹිදවත්ත අම්බලම



ගෙල්සගෙඩ අම්බලම



ද, සංචාරක මගපෙන්වන්නන් තුළින් ද සිදු විය යුතු බව අපගේ විශ්වාසයයි.

## සමාලෝචනය

ආසියාතික පැරණි මගියාගේ අවශ්‍යතා පිරිමසාලීම සඳහා සම්බාධක විරහිතව දිවා රාත්‍රී යන කවර අවස්ථාවක දී වුව ද ඉටු කරන ලද සේවය අති මහත් බව ලෝකයා හමුවේ ප්‍රකාශ කිරීමේ හොඳම නිදර්ශකයක් ලෙස අම්බලම පෙන්වා දිය හැකිය. ලොව කැපී පෙනෙන සංචාරක ආකර්ශිතයන් අතරට ශ්‍රී ලංකාව ගෙන ඒමේ පුරෝගාමීත්වය උදෙසා නව සංකල්ප තීරණය කිරීමේ දී අම්බලම වැනි සමාජ සංස්ථාගතයන් කෙරෙහි ද අවධානය යොමු කරමින්, ඒවා ලෝකයා හමුවේ ප්‍රදර්ශනය කිරීමට පමණක් නොව සුරක්ෂිත ලෙස අනාගතය වෙත දායාද කිරීමට ද කල්පනා කළ යුතුව ඇත.

**මූඛ්‍ය පද:** *අම්බලම, උරුමය, ගම, සංචරණය, සමාජය*